# සීතා රැගෙන දඬුමොනරය ගිය මඟ

රාමායනය කාව්‍යය තුල "පුෂ්පික විමාන" ලෙස හදුන්වන්නේ සිංහල භාෂාවෙන් දඬුමොනර යන්ත්‍රය ලෙස හඳුන්වන රාවනා රජුගේ යානය වේ. දඬුමොනරය ගුවනින් ගමන් කල හැකි යානයක් සේ සැලකේ. මොනරකුගේ ස්වභාවය නිරූපණයවන අයුරින් දැව ආශ්‍රයෙන් එහි සැකිල්ල නිර්මාණය කර තිබෙන්නට ඇතැයි සැලකේ. මෙහි යාන්ත්‍රික එන්ජිමක් තිබුනේ නම් එහි ඉන්ධනය ලෙස යොදා ගැනුනේ රසදිය නිශ්චල කිරීමේ තාක්ෂණ ක්‍රමවේදයක් බවට වර්තමානයේ බොහෝ විද්වතුන් මත පල කරයි. රාවනා විසින් සීතා දේවිය ඉන්දියාවේ සිට මෙරටට රැගෙන ආවේද මෙම දඬුමොනරයෙන් බවට සැලකේ. දඬුමොනර යන්ත්‍රය ගොඩබැස්සවීම හා ඉහළනැංවීම සඳහා භාවිතා කලේයැයි පැවසෙන ස්ථාන කිහිපයක්ම ලංකා පොලොව මත අදටත් දක්නට ඇත. එවන් එක් ස්ථානයක් විය හැකියැයි අනුමාන කලහැකි ප්‍රදේශයක් පිදුරුතලාගල කඳු පංතියේ රම්බොඩ කඳු ආශ්‍රිතව දැක ගැනීමට හැක. මේ අප එම ස්ථානය කරා ගිය ගමනයි.

### මෙම සංචාරය සඳහා උපදෙස්

**සංචාරයේ අරමුණු:** රාවණාගේ ගුවන් මාර්ගය වැටී තිබු ප්‍රදේශය පිළිබඳව කරුණු සොයා බැලීම, රාමායනය ආශ්‍රිත කරුණු පරීක්ෂා කර බැලීම, ස්වභාව සෞන්දර්යය නැරඹීම හා ඡායාරූප ගැනීම.

**දිනය :** 2013 ඔක්තෝබර් 18 සහ 19 දෙදින

**සහභාගී වුවන් ගණන:** 9

**ගමන් කල ආකාරය:** පොදු බස් රථ වලින්, කුලී වෑන් රියකින්, පාගමනින්

**නවාතැන:** කඳුමුදුනේ කඳවුරු බැඳීම

**විශේෂ ස්තුතිය** අශාන් ගීගනගේ - "ලක්දසුන්" වෙබ් අඩවිය (සංචාරයට අවශ්‍ය තොරතුරු සපයා දීම), කසුන් චතුරංග - පුස්සැල්ලාව (රාත්‍රි නවාතැන් සැපයීම)

**ඡයාරූප අනුග්‍රහය:** නිශාන් කුළසිංහ, නිසල් ප්‍රනාන්දු, අරුණ සුගතපාල, ලසිත රත්නායක

**මෙම වාර්තාව සැකසූයේ:** නිශාන් කුළසිංහ විසිනි.

**කොළඹ සිට ගමන් මාර්ගය:**

කොළඹ කොටුව > පේරාදෙණිය > ගම්පොළ > පුස්සැල්ලාව > හෙල්බොඩ වත්ත > ෆොට්‍රොෆ්ට් වත්ත > සීතාගේ කඳුළු පොකුණ සහ කඳු මුදුණ > මුල්ඔය වත්ත > රිකිල්ලගස්කඩ > මහනුවර > කොළඹ.

*අප සංචාරයේ ගූගල් අර්ත් ගමන් මග දැක්වෙන KMZ file එක ලබා ගැනීමට අවශ්‍ය නම් lakviskam@gmail.com වෙත ඔබගේ ඉල්ලීම යොමු කරන්න.*

www.LakViskam.org

### ගමනේ ස්වභාවය සහ පරිසරය පිළිබඳව

තරමක් දුෂ්කර ගනයේ ගමනකි. ගමන සඳහා දැඩි ආයාසයක් යෙදීමට අවශ්‍ය නොවේ. එහෙත් ඔබ නිරෝගී ශරීර සෞඛ්‍යයෙන් හා හොද මානසික ඒකාග්‍රතාවයකින් සිටිය යුතුමය. කඳුකර, තද ශීත දේශගුණය සහිතයි. මීදුමෙන් වැසී යන හදිසි වර්ෂා ඇද හැලෙන ප්‍රදේශයකි. මේ නිසාම කූඩැල්ලන්, ජල පහරවල්, ඝන වනාන්තර, ප්‍රදේශයේ බහුල වේ. දිවියන්, වල් ඌරන්, ගෝනුන්, මී මැස්සන් ආදී අනතුරුදායක සතුන් ප්‍රදේශයේ ගැවසේ. ජල මූලාශ්‍ර කිහිපයක් කඳු මුදුනේදී හමු වුවත් පහල වතුයායෙන් බීමට ජලය රැගෙන යන්න. නාය යාමේ අවදානමක් සහිතය, දළ බෑවුම් සහිත අඩි පාර හා කළුගල් තෙත බරිතව ඇති විට ඉතාමත් ලිස්සන සුළුය, ගල් පෙරලී යා හැක. ඒවායින් තුවාල සිදු වීමේ ඉහළ සම්භාවිතාවක් පවතී. අකුණු සැර පතිතවීමේ අවදානමක් ඇත. මේ සියලු පරිසර තත්ව වලට පෙර සූදානමක් ඇතිව ඇඳුම් බෙහෙත් ආදිය රැගෙන එහි යන්නේ නම් මැනවි. වැහි කබා, සීතලෙන් ගැලවිය හැකි ඇඳුම් අනිවාර්යවේ. කඳවුරු බදින්නේ නම් ශීතලට හා ආරක්ෂාවට ගිනිමැල ගැසීම නොකරන්න (ඉතා වැදගත්). වැසි සහිත අවස්ථාවල කූඩාරම් තුලට වැසි ජලය ඇතුළු වී ඔබව තෙතබරිත විය හැක.

### මේගැනත් සිතන්න

ඔබ මෙම ප්‍රදේශයට යාමට අදහස් කරන්නේ නම්, ඔබ ඇතුළු පිරිස එසේ යන්නේ කුමක් සඳහාදැයි හොඳින් අවබෝධ කරගන්න. හුදු විනෝදය සඳහා පමණක් එහි යන්නේ නම් මෙම පරිසර පද්ධතිය ඔබ ඇතුළු සියලු ජීවී ප්‍රජාවගේත් උරුමයක් නිසා එය ආරක්ෂා කර ගත යුතු බවට නිරතුරු සිහි තබා ගන්න. වෙනත් කටයුත්තක් සඳහා

එහි ගියද පරිසරය ආරක්ෂා වන අයුරින් කටයුතු කරන්න. මෙය ජල පෝෂක ප්‍රදේශයකි. ඔබ එහි ගෙන යන ප්ලාස්ටික් ඇතුළු සියලු අපද්‍රව්‍ය එම ප්‍රදේශයේ බැහැර නොකර ආපසු ගෙනවිත් නිසි ස්ථානයකදී පමණක් බැහැර කරන්න. ඔබ මත්පැන් පානය කර මෙම ප්‍රදේශ වල සංචාරය කිරීමෙන් වලකින්න. එය ඔබගේත් පරිසරයේත් එහි වෙසෙන සමස්ථ ජීවී ප්‍රජාවගේත් යහපතට ඉවහල් වේ. ජලය හැර පරිසර පද්ධතියෙන් කිසිවක් ලබා නොගන්න. මේ පරිසර පද්ධතිය සියලු ජීවී ප්‍රජාවගේය. එම නිසාවෙන් එම පරසරය සුරකින්න. අපෙන් පසුවට එන ජීවී ප්‍රජාවටත් එය ආරක්ෂා කර තබන්න.

**සීතාගේ කඳුළු පොකුණ සහ කඳු මුදුණට ගිය ගමන**

මෙම ගමනට අවශ්‍ය කෑම බීම, ඇඳුම් පැළඳුම්, කූඩාරම් ආදී සියල්ල කොළඹ සිට ගෙනයාමට අප තීරණය කළෙමු. ඒ ගමනේ අතරමඟට වැය වන කාලය අවම කර ගැනීමටයි. රාත්‍රී 10 නුවරඑළිය ලංගම බසයේ ආසන කලින් වෙන්කරවා ගැනීමට අප සමත් වූයෙමු. මිතුරකුගේ නිවසේ නතරවීමට තීරණය කල අප පාන්දර 2.30 ට පමණ පුස්සැල්ලාවෙන් බැස මිතුරාගේ නිවසට ගොස් නින්දට වැටුනෙමු. උදෑසන අවදිවූ මාහට නිරිතදිග දෙසින් දැක ගන්නට ලැබුනේ මනස්කාන්ත මොනරගල කන්දයි (පීකොක් හිල්ස්) (1518 m). එදින මීදුම තදින් නොතිබූ පැහැදිලි දිනයක් වූ නිසා මෙම කඳුවැටිය හොඳින් දර්ශණය විය.


මොනරගල (පීකොක් හිල්ස්)


පුස්සැල්ලාවේ සිට පිටත්වීමට සූදානමින්

www.LakViskam.org

උදේ ආහාරයට මිතුරාගේ නිවසින් ලබාදුන් කිරිබත් අනුභවකර පෙරවරු 6.55 ට පුස්සැල්ලාවෙන් ගමන් ආරම්භ කළෙමු. තවත් මිතුරන් තිදෙනෙකු පුස්සැල්ලාවේදී එක්විය. “ෆොට්‍රෝෆ්ට්” නොහොත් “පෙට්ටරාසි" වත්ත පිහිටා ඇත්තේ පේරාදෙණිය - නුවරඑළිය මාර්ගයේ නුවරඑළිය දෙසට යනවිට, වම් පසින් රම්බොඩ කඳු වල ඇතුල් පැත්තට වන්නට, පුස්සැල්ලාව හා රම්බොඩ දිය ඇල්ල අතර වේ. ෆොට්‍රෝෆ්ට් දක්වා ඩෙල්ටා වත්ත හරහා දිවෙන බස් මාර්ගය කඳුකර හා දුෂ්කර වූ ඉතා අබලන් වූ මාර්ගයකි. පුස්සැල්ලාවේ සිට ෆොට්‍රෝෆ්ට් වත්ත දක්වා ගමන් කරන “පෙට්ටරාසි”බස්රථ කිහිපයක් ඇත. මෙම බස් බොහෝ විට අධික ලෙස මගීන්ගෙන් පිරී ඇත. අප කණ්ඩායමේ නව දෙනකු සිටි නිසාත් කූඩාරම් ඇතුළු ගමන් මළු වූ නිසාත් මිතුරෙකු මාර්ගයෙන් රු. 3000/= ක කුලියට වෑන් රථයක් කලින් සූදානම් කරගත්තෙමු. දවල් ආහාරය සඳහා තොසේ මිලට ගෙන වෑන් රථයෙන් පෙ.ව.7.15 ට පුස්සැල්ලාව නගරයෙන් ගමන ආරම්භ කළෙමු. පෙට්ටරාසි - පුස්සැල්ලාව බස් රථය ගමන් කරන මාර්ගය ඉතා අබලන් නිසා පේරාදෙණිය නුවරඑළිය මාර්ගයේ රම්බොඩ දෙසට ගමන් කර පුස්සැල්ලාව වැවිලි සමාගමට අයත් “හෙල්බොඩ වත්ත” මැදින් දිවෙන වතු මාර්ගයක් ඔස්සේ ගමන් කළෙමු. මෙම මාර්ගය ඇතැම් ස්ථාන වලදී ඉතාමත් පටු වන අතර ඇතැම් ස්ථාන කොන්ක්‍රීට් අතුරා සකසා ඇත. අතිශය නෙත්කළු දර්ශන පෙළක් මෙම මාර්ගයේදී නැරඹීමට හැකි විය. මේ අතර කොත්මලේ ජලාශය, ශ්‍රී පාද කන්ද, මොනර ගල (පීකොක් හිල්ස්), කිකිලියාමාන කඳු, කබරගල කඳු, පිදුරුතලාගල කඳු සහ අවට තේ වතු ප්‍රධාන වේ. හෙල්බොඩ වතුයායේ ඉහල කොටසේදී තරමක් කැලෑබද ප්‍රදේශයන් හමු වන අතර “දිවියන්ගෙන් ප්‍රවේශම් වන්න” යනුවෙන් සඳහන් දැන්වීම් පුවරුද සවිකොට ඇත.





කොත්මලේ ජලාශය හා ෆොට්‍රොෆ්ට් වත්තේ සිට දුටු අවට අසිරිය

අප ගමන්ගත් මාර්ගය පෙට්ටරාසි බසය ගමන් කරන මාර්ගයට අතරමඟදී සම්බන්ධ වේ. එම ස්ථානයේ සිට අගලවත්ත වැව්ලි සමාගමට අයත් ෆොට්‍රොෆ්ට් වත්ත ඔස්සේ ගමන් කල යුතුය. අබලන් තත්වයේ පවතින මෙම මාර්ගයේදී නව ෆොට්‍රොෆ්ට් ප්‍රාදේශීය රෝහල හා කෝවිල් කිහිපයක් හමු වේ. පෙ.ව. 8.20 වන විට අප බස් මාර්ගයේ අවසානය වන අත්හැර දැමූ පැරණි ෆොට්‍රොෆ්ට් රෝහල අසලට ළඟා වූයෙමු. වැන්රියේ ගාස්තුව ගෙවා ෆොට්‍රොෆ්ට් රෝහල අසල සිටි කම්කරුවන්ගෙන් ගමන් මාර්ගය පිලිබඳව අවබෝධයක් ලබා ගත්තෙමු. දෙමළ භාෂාව දන්නා මිතුරන් දෙදෙනෙකු කණ්ඩායමේ සිටීම ගමන පුරාවට අපට අත්වැලක් විය. ගමනේ ආරම්භක ස්ථානයට තේ වතු මැදින් ඉහලට ගමන් කල යුතුය.මෙහිදී පැහැදිලි දිය පාරක් හමු වන අතර බීමට අවශ්‍ය ජලය මෙහිදී පුරවාගත හැක. මිනිස් වාසස්ථාන ප්‍රදේශයේ ඇත්තේ අල්ප වශයෙනි. දුරකථන සංඥා දුර්වල මට්ටමක පැවතියත් බොහෝ ස්ථාන වලට ඇමතුමක් ලබා ගැනීමට හැකි ප්‍රමාණයට සංඥා ලැබේ.

www.LakViskam.org



පෙට්ටරාසි බස් මාර්ගය හමුවන තුන්මං හන්දිය



පැරණි ෆොට්‍රොෆ්ට් රෝහල

මෙහිදී රාවනා රජුගේ අගනගරය පිහිටි ස්ථානය ලෙස අනුමාන කරන “ලංකාපුර” පෙදෙස හා සීතා දේවිය රැඳවූ අශෝක උයන අතරින් දිස්වෙන කඳු පංතිය පිලිබඳව ඇති තොරතුර ගවේෂණය කිරීමටද අප අමතක කලේ නැත. එම තොරතුරු අනුව මෙම ෆොට්‍රොෆ්ට් වත්තේ සිට ඉහත කී ස්ථාන දෙක අතරින් දිස්වන කඳු පංතියේ ඇති කඳු මුදුනතක් "පාවල මලයි" නම් වේ. එහි අදහස නම් "මුතු කන්ද" යන්නයි.



කන්ද වෙත යන පා ගමන ආරම්භ කරමින්



මෙහි දිස්වන්නේ “පාවල මලයි”(මුතු කන්ද) ද?

හනුමාන් භාරතයේ සිට සීතා සොයා ලංකාව දෙසට එක පිම්මේ පැන්න බවත් ලංකාවේදී හනුමා ඔහුගේ පළමු පාදය තැබුවේ මෙම කඳු මුදුනතට බවත් කියවේ. රාවනා රජුගේ අගනගරය වන "ලංකාපුර" නකල්ස් කඳු පංතියේ මීමුරේ ආසන්නයේ ඇති ලකේගල ආශ්‍රිතව හෝ මෙම පිදුරුතලාගල කඳු පංතිය ආශ්‍රිතව තිබු බවට පැවසේ. එසේම රාමායනයට අනුව සීතා දේවිය රැඳවූ අශෝක උයන නොහොත් "අශෝක වටික" නම් ස්ථානය පිහිටියේ නුවරඑළිය හක්ගල කන්ද ආශ්‍රිතව ඇති වනාන්තරයේ බවට සැලකේ. ෆොට්‍රොෆ්ට් වත්තේ සිට දිස්වන මෙම "මුතු කන්ද" දැකිය හැක්කේ මෙම ලංකාපුර හා අශෝක වටික ස්ථාන දෙක අතරින් බව කියවේ. මෙම ස්ථාන සිතියමක සලකුණු කල විට මෙම "මුතු කන්ද"දිස්විය යුත්තේ නැගෙනහිර හා ගිනිකොන අතරින් නැගෙනහිර දෙසට වඩාත් බරවය. මෙවිට මුලින්ම දෘශ්‍යමාන වන්නේ පිදුරුතලාගල කඳු පන්තියේම කඳුය. මෙය බොහෝවිට මෙම මුතු කන්ද යනුවෙන් හඳුන්වන ස්ථානය විය යුතුය. මෙම කඳුවලට පසුපසින් එළමුල්ල ප්‍රදේශයේ කබරගල්ල කඳු පසුතලයෙන් දිස් වේ.

www.LakViskam.org




මුතු කන්ද සිතියමකින්

වනාන්තරයට ඇතුළු වන ස්ථානය සොයා ගැනීමට එතරම් අපහසු නොවුයේ අප සතුව පැවති ජී.පී.එස්. උපකරණය නිසාය. කෙසේ වෙතත් වත්තේ වැඩට යන සෙල්වම් නම් කම්කරුවකුද අප සමග කි.මී. එකහමාරක් පමණ වනාන්තරයට ඇතුළුවන ස්ථානය දක්වාම පැමිණියේය. ඔහු සදහන් කලේ අඩි පාර දිගටම ඇති බවත් වතු සේවකයන් පෙට්ටරාසි සිට කඳු පංතියෙන් අනෙක් පස වූ හේවාහැට ප්‍රදේශයට ගමන් කිරීමට හා කැලෑවට පිවිසීමට මෙම අඩි පාර භාවිතා කරන බවත්ය. එසේම ඉන්දියානු ජාතිකයින් මෙම මාර්ගය ඔස්සේ කඳු මුදුනට පැමිණෙන බව ඔහු විසින් සඳහන් කරන ලදී. කැලෑව තුලදී ප්‍රධාන අඩිපාර එක් ස්ථානයදී තවත් අඩිපාරක් ලෙස වම් පසට ඇති බවත් එම අඩි පාරේ ගමන් නොකරන ලෙසත් සෙල්වම් විසින් අපට දන්වන ලදී. එසේම මෙම ප්‍රදේශ වලින් හමුවන සීතා ගුලි නොහොත් සීතා කැට නම් සන ගුලි විශේෂය ගැන ඔහුගෙන් විමසා සිටියෙමු. ඔහු සඳහන්කලේ කඳු මුදුනේ කැලෑ පෙදෙසේ මෙම ගුලි දක්නට ලැබෙන බවත්, කලාතුරකින් තේවතු වලින්ද හමු වන බවත්ය. රාවනා රජතුමා දඬුමොනරයෙන් සීතා දේවියව ගෙන යද්දී ඇයගේ කුසගිනි නිවා ගැනීමට කිරිබත් ගුලි ලබා දෙන ලදී. ඇය ඒවා ප්‍රතික්ෂේප කර යානයෙන් පිටතට විසිකල විට දසත විසිරී සනවී මෙම සීතා ගුලි සෑදුන බවට ජනප්‍රවාදයේ එයි. අදටත් පිදුරුතලාගල ආශ්‍රිත වතු හා කැලෑවලින් මෙම ගුලි ඉදහිට හමුවන අතර වතුකම්කරුවන් බඩේ හා හිසේ කැක්කුම් වලට ඔසුවක් ලෙස භාවිතා කරයි. මෙම ගමනේදී අපද මෙම ගුලි සොයා ගැනීමට උත්සහා කලද හමු නොවීය. මතු සංචාරයකදී මේ පිලිබඳව වැඩිදුර සොයා බැලීමට බලාපොරොත්තු වන්නෙමු.



සෙල්වම් මහතා



කැලෑවට ඇතුළුවන ස්ථානය

www.LakViskam.org

කැලයට ඇතුළුවීමට පෙර සමහර සාමාජිකයන් සපත්තු පැලඳ ගත් අතර එය ගල් හා පදුරුවලින් සිදුවිය හැකි සීරීම් වලක්වා ගැනීමට මහත් උපකාරයක් වුවත් ලිස්සායාමේ ස්වභාවය නිසා යම් අනතුරුදායක බවක්ද විය. අඩි පාර දිගේ අප පෙ.ව.8.55ට ගමන ආරම්භ කළෙමු. වනාන්තරයට පිවිසි වහාම අප ඇස ගැටුනේ වල් ඌරා විසින් අළුත පලුදු කරන ලද පොළොවයි. වැඩි ශබ්ද නොනගා අප ඉදිරියට ඇදුනෙමු. ගමනේ මුල් කොටස එතරම් අපහසු නොවන අතර ක්‍රමික නැග්මක් පවතී. ජී.පී.එස්. උපකරණය මගින් ගමනාන්තය නිරීක්ෂණය කරමින් ගිය අපට දැක ගත හැකි වුයේ ගමන් මාර්ගයේ වූ අක්‍රමික ගලා යාමයි. අප ළගා වියයුතු කඳු මුදුන දකුණට බරව දිස්වූ අතර විශාල ගල් තලාවක් සහිත කන්දක්ද අපට තවත් දකුණු පසට වන්නට පිහිටියේය. මෙම කන්දට ගමන් කර රාත්‍රිය එහි ගත කිරීමට සැලසුමක් තිබුනද එය මෙම ගමනේදී ඉටු කර ගැනීමට නොහැකි විය. කූඩැල්ලන් කිහිපදෙනෙක් දුටු නිසා ඊට සූදනමක් වශයෙන් සිද්ධාලේප, පැගිරිතෙල් දෙපා වල අලේප කරගෙන ඉදිරියට ඇදුනෙමු. කෙසේ වෙතත් අප හට ගමන පුරාවට කූඩැල්ලන්ගෙන් තදබල කරදරයක් නොවීය.



වල් ඌරෙකු විසින් බිම පළුදු කර



කූඩැලී විකර්ෂක අලේප කරමින්

ඉදිරියට ගමන් කිරීමේදී සෙල්වම් සඳහන් කල ආකාරයේ වම්පසට විහිදෙන මාර්ගයක් හමු වුයෙන් ඒ ඔස්සේ ගමන් නොකර කෙලින් ගමන් කළෙමු. ටික දුරක් ගිය පසු මාර්ගය අපැහැදිලි වන බවක් දක්නට ලැබුණු අතර වනාන්තරයද ඝණ විය. ජී.පී.එස්. උපකරණයද මෙම මාර්ගය නිවැරදි නොවන බව දැක්වුයෙන් අවට පිරික්සා බැලීමේදී පෙරකී වමට විහිදෙන මාර්ගයේ අතරමැද ස්ථානයක් හමු විය. ඒ ඔස්සේ ඉදිරියට යාමේදී එය නිවැරදි මාර්ගය බව පෙනී ගියේය (වමට විහිදෙන තවත් මාර්ගයක් පසුව හමු වූ අතර එය එතරම් පැහැදිලි එකක් නොවීය. කම්කරුවා සඳහන් කරන්නට ඇත්තේ එම මාර්ගය වියයුතුයැයි පසුව පැහැදිලි විය). මෙම ප්‍රදේශයේදී කන්දේ නැග්ම තරමක් දැකිය හැකි වූ අතර මහරත් මල් ගස්, නෙළු මල් ගස්, මීවන ආදී ශාඛ මහ දෙපස දක්නට ලැබුණි. පෙ.ව. 10.20 පමණ වන විට අප ගමන් කරමින් සිටියේ සමතලා මාර්ගයක් ඔස්සේය. අප කඳු මුදුනට ඉතා ආසන්න බව හැඟී යන ගියේ තණකොළ පඳුරු අතරින් මාර්ගය විහිදී තිබූ නිසාය. එසේම නෙළු හා අනෙකුත් ගස්වල වර්ණවත් භාවය හා මල් පිපී ඇති ප්‍රමාණය ක්‍රමයෙන් වර්ධනය වන අයුරු දක්නට ලැබුණි. පෙරවරු 10.25ට අප පිවිසියේ දැස් අදහාගත නොහැකි ලෙස නෙළු පඳුරු වලින් වටවූ තණකොළ පඳුරු වලින් වැසුනු විශාල දර්ශනීය හිස් භූමියකටයි. එම ස්ථානය දුටුවිටම අප තුල යම් අමුත්තක් ජනිත කරවූයේ එම අලංකාර හා අසාමාන්‍ය පිහිටීම විය හැක. වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම එය හා අවට පරිසරය පාරාදීසයකි. එදින ඉතා පැහැදිලි පරිසරයක් සහිත දිනයක් වුයෙන් අවට මනාව දර්ශනය විය.

www.LakViskam.org



තණකොළ සහිත කඳු මුදුනේ මුල් දසුන



හිස් තණකොළ පිටිය

උතුර, නැගෙනහිර, දකුණ හා නිරිත දිග දෙසට වශයෙන් විහිදී යන මෙම හිස් පෙදෙස කඳු මුදුන පුරා විශාල ප්‍රදේශයක් පුරා පැතිරෙන අතර මදක් සමතලා ස්වභාවයක් ගනී. අතරින් පතර මහරත් මල් ගස් කිහිපයක්, ඝනව නෙළු පඳුරු හා අමුතුම හැඩයේ පත්‍ර සහිත විවිධ ශාඛද දක්නට ඇත. ඝණ නෙළු පඳුරුවලට මායිම්වන සේ ඝනකම තණකොළ තට්ටු වැවී ඇත. එම තණකොළ අතර ඉතා අලංකාර කුඩා මල් පිපෙන පැළෑටි ඇති අතර වැල් ගොටුකොල ශාකයද දක්නට ඇත. තණකොළ තට්ටුවට යටින් ඇතැම් තැනෙක ජලය ඇති අතර මදවශයෙන් එරෙන ස්වභාවයක්ද ඇත. ගිනිකොන දෙසට වන්නට පිදුරුතලාගල කඳු පංතියේ මීලග කන්ද දැකිය හැකි අතර එහි සිට ගලා එන පිරිසිදු දිය පහරක් ඇත.





කඳු මුදුන චන්ද්‍රිකා ඡයාරූපයෙන් දිස්වෙන අයුරු

සීතාගේ කඳුළු පොකුණ

රාවනා රජතුමාගේ දඬුමොනර යන්ත්‍රය අහසින් ගමන් කල මාර්ගය මෙම ස්ථානය හරහා විහිදී තිබුන බවටත් සීතා දේවියව රාවනාගේ අග නගරය වූ ලංකාපුරයේ සිට අශෝක උයන වෙත රැගෙන යන අතරේ දඬු මොනරය මෙම ස්ථානයේ නතර කර සීතාට සිය රාජ්‍යයේ අලංකාරය පෙන්වූ බව කියවේ. කඳු මුදුනේ හිස් තණකොළ ඇති කොටසේ කිසිදු විශාල ගසක් නොවැවෙන අතර අදටත් එය එසේම දක්නට ලැබේ. සීතා දේවිය ඇඬූ කඳුලින් මෙම ස්ථානයේ කුඩා පොකුණක් නිර්මාණය වූ බවත් එම පොකුණ “සීතාගේ කඳුළු පොකුණ” නම් වූ බවත් පැවසේ. මෙම කුඩා පොකුණ අදත් මෙම ස්ථානයේ ගිනිකොණ දෙසට වන්නට දක්නට ඇත. දැඩි නියගයකදී අවට ගංගා, දිය පහරවල් සිදී ගියද මෙම පොකුණ සිදී නොයන බවට පැවසේ. ඉන්දියානුවන් තුල මෙම ප්‍රදේශය අවට ඇති මහරත් ගස් වල මල් පිළිබඳවද මෙවන් අදහසක් පවතී. ඒ මහරත් මලේ පෙනුම රාමගේ රුව සිහිගන්වන බවත් රතු පැහැති මේ මල “සීතා මල” නමින් හඳුන්වන බවත්ය. “සීතා මල” නොහොත් මහරත් මල ඉහල කඳුකරයේ පමණක් දක්නට ලැබේ.

www.LakViskam.org





සීතා මල්

නිරිත දිග දළ බෑවුම අසල

නිරිතදිග දෙසට විහිදී යන හිස් තණකොළ සහිත භූමිය මදක් ඉහලට එසවෙමින් ගොස් එක්වරම දළ බෑවුමක් බවට පත්වී එම බෑවුම දිගේ පහලටද තණකොළ පඳුරු විහිදී යයි. දඬුමොනර යන්ත්‍රය ගුවන් ගතවීම වර්තමාන ගුවන් යානයක ආකාරයට සිදු වූයේ නම් එයට වඩාත්ම සුදුසු ධාවන පථය මෙය විය යුතුය. මෙම දළ බෑවුම් ස්ථානයේ සිට බලන විට කොත්මලේ ජලාශය හා හැටන් දෙසින් ශ්‍රී පාද කඳු මුදුන හොඳින් දර්ශණය වේ.





බිම විසිරුණු පූජා භාණ්ඩ

සිරිපා කඳු මුදුන

අවට භූමිය පරික්ෂා කිරීමේදී මාස කිහිපයකට පෙර යම්කිසි පුද්ගලයින් පිරිසක් නිදන් හෑරීමට ගත් උත්සාහයක් වැනි දෙයක සලකුණු දක්නට ඇත. ඒ සඳහා භාවිතා කල පූජා භාණ්ඩ ආදිය බිම විසිරී තිබෙන අයුරුත් විශාල වලක් හාරා තිබෙන අයුරුත් නිරීක්ෂණය කල හැකි විය. ක්‍රමයෙන් දහවල ලඟා වුයෙන් බිස්කට් අනුභව කර ජලය නැවත පුරවාගෙන ගිනිකොන දෙසින් වූ පිදුරුතලාගල කඳු පංතිය ඔස්සේ ඉදිරියට යාම ආරම්භ කළෙමු. කිසිදු පැහැදිලි අඩි පාරක් හෝ නොතිබුණු මෙහි ඝන නෙළු පඳුරු අතරින් ඉදිරියට යාම ඉතාමත් අභියෝගජනක, අනතුරුදායක හා කාලය විශාල වශයෙන් වැයවන බව පෙනුණු නිසා එම අදහස මතුවට ඉතිරිකොට නැවත පෙර කී තණකොළ පිටියට පැමිණ කඳවුරු බැඳීමට තීරණය කළෙමු. මේ අවස්ථාවේ ගෝනුන් කෑගසන ශබ්ධය පැහැදිලිව ඇසුණු අතර ඔවුන් අපගේ පැමිණීම නොරිස්සුවාසේය. අඩි පාරේ ලිස්සනසුලු ස්වභාවය නිසා අප සගයන් දෙදෙනකු පය ලිස්සා වැටුණු අතර ඉන් එක් අයකුගේ අත ගලක වැදී අස්ථි පිපිරීමක් සිදු විය. ඔහුට ප්‍රථමාධාර ලබා දෙන අතරතුර එතෙක් පැහැදිලිව තිබුණු පරිසරය ක්‍රමයෙන් අඳුරුවී මීදුම ගලා එන්නට විය. වැසි වලාකුළු හා ගිගුරුම් හඬ වර්ෂාව ඉතා ආසන්න බවට සන්නිවේදනය කළේය. අප තෝරාගත් ස්ථානයේ කූඩාරම් ඇටවීම සිදුකරන අතරේ පොද වර්ෂාවක් ආරම්භ විය. එවිට වෙලාව ප.ව. 12.35 විය.

www.LakViskam.org





කූඩාරම් අටවමින්

පසුදින ගමන් ආරම්භ කරමින්

හැකි ඉක්මනින් කූඩාරම් තුනම අටවාගත් අප වර්ෂාවේම තෙත බරිතව ඇතුලට රිංගා ගතිමු. අධික වෙහෙස හා වර්ෂාව නිසා කුසගින්න තදින් දැනුනෙන් දවල් ආහාරයට ගෙන ආ තොසේ කූඩාරම් අතර හුවමාරු කරගෙන අනුභව කළෙමු. තද සුළඟ, වර්ෂාව හා මීදුම නිසා සීතලෙන් පීඩා විඳීමට අපට සිදු විය. කූඩාරම් ඇතුලට වතුර බිංදු වහනය වන්නට වුයෙන් අප වඩාත් අපහසුතාවයට පත් වූයෙමු. වර්ෂාව අඩු වූ විට පිටත බැලූ අපට පෙනුනේ තද මීදුමෙන් අවට වැසී ඇති පරිසරය හා කලින් සඳහන් කල ජල පහර ඉතා විශාල ජල පහරක්වී ශබ්ධ නගමින් කන්දෙන් පහලට ගලා එන අයුරුයි. වර්ෂාව අඩු වැඩි වෙමින් සවස 6 පමණ වනතෙක් පැවතුනි. එදින පසළොස්වක පොහොය දිනයක් වුයෙන් රාත්‍රියේ පුන් සඳ පායා පැහැදිළි අහසක් දක්නට විය. රාත්‍රී ආහාරයට සැමන් සම්බෝලයක් සකස් කර මාජරීන් සමග පාන් අනුභව කොට නින්දට ගියෙමු. අධික සීතල නිසා නින්ද අසලකවත් නොවීය. අවදිව සිටින අවස්ථා වලදී අප ගෙනගිය විශාල ඉටිපන්දම් කූඩාරම් ඇතුලේ දල්වා තරමක් හෝ උණුසුම සපයා ගත්තෙමු.



අතරමග වූ කුඩා දිය ඇල්ලක්



මූල්ඔය වත්තේ අසිරිය

පසුදින උදෑසන ක්ෂණික නූඩ්ල්ස් සකසා ආහාරයට ගෙන හේවාහැට දෙසින් මූල් ඔය වත්ත බලා ගමන් ආරම්භ කළෙමු. ෆොට්‍රොෆ්ට් වත්තේ සිට වූ නැග්මට වඩා ඉතා දළ බෑවුමක් මුල් ඔය වත්ත දෙසට විය. මෙදින ගමනේදී අපට විවිධ ප්‍රමාණ වල දිය ඇලි 4 ක් පමණ හමු විය. මේ දිය ඇලි බොහොමයක් වනාන්තරය ඇතුලට වන්නට පිහිටා ඇති නිසා පැහැදිලි ජායරූපයට නැගීම අපහසු විය. පැය දෙකක පමණ ගමනකින් පසු තේවත්තේ ආරම්භක මායිමට පැමිණීමට හැකි විය. ඉතා දර්ශනීය මුල් ඔය වත්ත හරහා මාර්ගයට පැමිණ මුල්ඔය වත්ත - මහනුවර බසයට ගොඩ වූයෙමු. මෙම බසයෙන් රිකිල්ලගස්කඩ හරහා මහනුවරට පැමිණ කොළඹ බලා ආවෙමු.




www.LakViskam.org

අපගේ පළමු දින ගමන් මඟ

**තවත් ජයාරූප හා වීඩියෝ එකතුවක් මෙතනින් නරඹන්න**
https://picasaweb.google.com/102500057347588371605/AirChariotPathOfRavanaSDandumonara2013?noredirect=1
වීඩියෝ: http://youtu.be/ur8tnDGlhH8

මෙම වාර්තාවේ අයිතිය “ලක් විස්කම්” වෙබ් අඩවිය සතුය. © www.lakviskam.org

lakviskam@gmail.com (2013 නොවැම්බර් 10)